(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් සහ

වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය :

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතුය ;
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝර්මවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා ඔවුන්ගේ ලිපියන්ද සඳහන් කර තිබිය යුතුය ;
(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතුය.

මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිත් කළයුතු අතර, නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 දින අංක 207 දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් හෝ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

04. තැබෑරුම වෙනුවෙන් එක් අයෙකුට එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස් දෙනෙකුට වඩා හවුල්ව ද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැකිය.

05. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරයෙහි වම් කෙළවරේ අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම් ටෙන්ඩරය 2007 යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් සහිත කවර,

(අ) හොරණ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ; හෝ
(ආ) ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම්, 2006.10.23 වැනි දින පෙරවරු 10.30 වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ, "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය. හොරණ" යන ලිපිනයට එවිය යුතුය. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුය. මෙහි තුන්වන ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සෙකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට වුවමනා ලියකියවිලි ද රැගෙන පැමිණිය යුතුය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතුය.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය හොරණ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත. රේන්ද විකිණීමේ කොන්දේසි වලට අනුකූල නොවන හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් කර ඉදිරිපත් නොවූ හෝ ටෙන්ඩර් භාරගනු නොලැබේ.

08. 2007 වර්ෂයට දැනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට විදේශීය මත්පැන් තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල මොනයම් හේතුවක් නිසා හෝ 2007 වර්ෂය වෙනුවෙන් එම කාර්යය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරා ගන්නා ලද අළුත් ස්ථානය විවෘත කිරීමට පෙර යෝග්‍යතාවය පිළිබඳව හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු අතර, ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුලත සාර්ථක ටෙන්ඩර්කරු විසින් එම ගොඩනැගිල්ල අනුමත කරවා ගත යුතුය.

09. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් දැනගත හැකිය.

10. මෙම දැන්වීම අනුව 2006.10.23 දිනදී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2006.11.20 දින පෙ.ව. 10.30 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බවද, එසේම නැවත විකිණීමද 2006.11.20 වැනි දිනයේදී සිදු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. ඒ. ඩග්ලස්,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

හොරණ,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

හොරණ අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම් රේන්දය විකිණීම

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසයේ නම* | *ප්‍රාදේශීය ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කරන වේලාවන්* | *තැබෑරුම වසන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *2006.10.23 දිනදී විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | හොරණ නගර සහා ප්‍රදේශය | හොරණ නගර සහා සීමාව | පෙ. ව. 9.00 | ප. ව. 11.00 | 2006. 10. 20 වැනි දින පෙ. ව. 10.30 | 3,000 | 2006. 11. 20 වැනි දින පෙ. ව. 10.30 |

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - ඉබ්බාගමුව ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කුඹුක්වැව පාසල අවටින් තම්මිට ගමේ පිහිටි ගල්ගොඩේවත්ත නමැති ඉඩමට සාදා ඇති අංක 5957 සහ 1995.01.24 දින දරන පිඹුරේ ලොට් 1 දරන විශාලත්වය අක්කර 0 රූඩ් 01 පර්චස් 11.7 ක් විශාල ඉඩම සහ ඊට අයිති වටිනා ගොඩනැගිල්ල මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2006.10.23 දින පෙ.ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 2003.09.21 දින ද, දිනමිණ පුවත්පතේ 2003.09.19 දිනද, ඩේලි නිවුස් පුවත්පතේ 2003.09.19 දින ද, තිනකරන් පුවත්පතේ 2003.09.19 දිනදී ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– කුරුණෑගල සිට මඩගල්ල පාරේ සැ. 14 ක් ගියවිට කුඹුක්වැව පාසල අසලින් දකුණු අතට ඇති වැලිපාරේ යාර 50 ක් පමණ ගියවි ය මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 037-2222453 ෆැක්ස් අංකය : 037-2222338

හිමිකම් හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක් වූ මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාමවිනිසුරු),
උසාවි කොමසාරිස් බලයලත්, වෙන්දේසිකරු සහ තක්සේරුකරු,

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත, කුරුණෑගල.
දුරකථන අංකය : 037-2220062

09-870

## සීමාසහිත සෙලාන් බැංකුව - මාලබේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල පාදුක්ක හි ලියාපදිංචි අංක ඩබ්ලිව්. ඊ. 190 දරන ගලගෙදර වෙට්ල් ක්‍රෂර්ෂ් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තලංගම උතුරහි කංකානිගේ ලයනල් කරුණාරත්න පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*පළමු විකිණීම - දේපල හැඳින්වීම* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කොරතොට ගමේ පිහිටි 1994 මාර්තු 10 දිනැති අංක 711 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් ලේක් ටෙරස් නමින් හඳුන්වනු ලබන වනපොතු මුකලාන *හෙවත්* වයි එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 24 ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විසිපහයි දශම හතයි අටක් (අක්. 0, රූ.0, පර්. 25.78 විශාල ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ජී 974/180 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2006 ඔක්තෝබර් මස 17 වන දින පෙරවරු 10.00ට ඉහත දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම* :- අතුරුගිරියේ සිට ශාන්ත ලෝකාගම පාරේ (මිලේනියම් සිටි නිවාස සංකීර්ණය පසුකර) සැතපුම් 1 1/2 ක් ගොස් දකුණට ඇති ලේක් ටෙරස් පාරේ, පළමු පියවර යනුවෙන් සඳහන් ස්ථානයේ පිහිටා ඇත. (යාර 150ක් පමණ දුරින්

*දෙවන විකිණීම - දේපල හැඳින්වීම* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, මැද පත්තුවේ, සීතාවක ප්‍රාදේශීය සභා සීමාව තුල ගලගෙදර පිහිටි 1975.10.04 දිනැති අංක 5861 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල් ගොඩේවත්ත නමති ඉඩමේ කැබලි අංක 2 ඩී ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිනමයහමාරක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 29 1/2) විශාල ගොඩනැගිලි ගස්, යන්ත්‍ර සූත්‍ර සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 8/39 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන්න දේපල 2006 ඔක්තෝබර් මස 17 වන දින පෙරවරු 11.30ට ඉහත දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම* - ගලගෙදර හංදියේ සිට පාදුක්ක පාරේ යාර 50ක් ගිය විට දේපලට පිවිසිය හැක.

යෝජනා සම්මුති දැන්වීම 2005.05.06 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2005.04.19 වන දින ඩේලි නිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල ද පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*— විකිණීම ස්ථිර කළ වහා ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ. ගැනුම් මිලෙන්

සියයට දහයක් (10%) පළාත් පාලන බදු සඳහා සියයට එකක් (1%), වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකහමාරක් (2 1/2%), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ ගාස්තු සඳහා රු. 2,000 ක්, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500ක්, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලතදී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සා වි.)
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච් ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.

දුරකථන අංක : 2696155, 2572940

09-889

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - මාවනැල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පදිංචියට සුදුසු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාවෙල ගමේ පිහිටි "බුඩ්ගේවත්ත" නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සියලු පහසුකම් සහිත නිවස ඇතුලු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 15.

මෙම දේපල දසනායක මුදියන්සේලාගේ සාලින්ද බණ්ඩාර දසනායක යන අය බන්ධනදායී ලෙසට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2006ක් වූ ඔක්තෝබර් මස 26 වන දින පෙ. ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.3.10 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.03.04 වන දින ලංකාදීප, අයිලන්ඩ් හා තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*— මාවනැල්ල නගරයේ සිට මහනුවර මහා මාර්ගයේ කි. මී. 4ක් පමණ ගනේතැන්න හන්දිය දක්වා ගමන් ගෙන එහිදී දකුණට හැරී මහන්තේගම මහා මාර්ගය ඔස්සේ මීටර් 400ක් පමණ ගමන් කර වම් දෙසින් පිහිටි මාවෙල පාරට පිවිස මීටර් 700ක් පමණ ගමන් ගත්විට අදාල දේපල පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*— විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ; ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ; සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයට හෝ මාවනැල්ල ශාඛාව වෙත ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.

කළමණාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, මාවනැල්ල ශාඛාව.

අංක 51, නුවර පාර, මාවනැල්ල
දුරකථන අංක : 035-2247884, 035-2247886-7
ෆැක්ස් අංකය : 035-2247885

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව, මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් අංකය : 081-2211025

09-896/3

---

## මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුල දෙනගමුව පිහිටි දෙනගමුව වත්තට සාදා ඇති අංක 293/86 සහ 1987.01.20 දිනැති පිඹුරේ සඳහන් ලොට් 23 දරන විශාලත්වය පර්. 19ක් විශාල ඉඩම සහ නිවස මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2006.10.26 දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2001.05.04 දින ද, දිනමිණ පුවත්පතේ 2004.11.19 දින දීද, ඩේලි නිවුස් පුවත්පතේ 2004.11.19 දින දීද, තිනකරන් පුවත්පතේ 2004.11.19 දින දීද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*–කුරුණෑගල දඹුල්ල පාරේ සැ. 2 3/4 ක් පමණ ගොස් බඩගමුව උතුරු ඩිපෝව සමීපයෙන් දකුණට ඇති ගම් සහා පාරේ සැ. 1/4ක් පමණ දුර යන විට ගම් සහා පාරට මායිම් ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ;
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ;
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක් ;
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු ;

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 037-2222453 ෆැක්ස් අංකය : 037 : 2222338

හිමිකම් හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.

දුරකථන අංකය : 037-2220062

09-871

---

## ලංකා බැංකුව-මහනුවර අධිශ්‍රේණිය ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 290/2001.

ණයකරුගේ නම : මහනුවර, මුල්ගම්පොල, විලියම් ගොපල්ලව මාවත, අංක 691/45 දරන ස්ථානයේ පදිංචි පොල්ගොල්ල ගෙදර ප්‍රේමසිරි ජයලත් ලියනගේ මහතා

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.09.24 දිනැති අංක 1,360 දරන *ගැසට් පත්‍රයේ* හා 2004.09.13 දිනැති "දිනමිණ", "තිනකරන්" හා "ඩේලිනිව්ස්" යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය සහ ගාස්තු එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2006.10.25 වෙනි දින පෙ. ව. 11.00ට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, කළුගම්මනසිය පත්තුවේ, යටිහලගල උඩගම හි පිහිටි මහනුවර දිසා අධිකරණයේ අංක එල්. 14419 දරන නඩුව සඳහා මහනුවර බලයලත් මිනින්දෝරු තැන වන ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් මහතා විසින් සාදන ලද 1987.01.24 දිනැති අංක 2913 දරන පිඹුරේ විස්තර කර ඇති, "මොරවෙලහේන හා මැද දෙනියේ වත්ත" යැයි හඳුන්වනු ලබන, දැනට එක දේපළකින් සමන්විත අංක 2913 දරන පිඹුර අනුව උතුරට : මොරවෙලයායේ හේන *හෙවත්* මොරදෙනිය වත්ත ද, නැගෙනහිරට : මැද දෙනිය වත්තේ ශේෂ කොටස ද, දකුණට : මැදදෙනිය හේන *හෙවත්* මොරවෙල වත්තේ කොටස ද, බස්නාහිරට : මොරවෙල වත්ත, මොරවෙල කුඹුර ද මායිම් වූ අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් දෙකක (අ. 3, රූ. 3, පර්. 2) වපසරියකින් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ ඇති වගාවන් හා සෑම සියළු දේ ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 520/254 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර,
ප්‍රධාන කළමනාකරු.
ලංකා බැංකුව,
මහනුවර අධිශ්‍රේණි ශාඛාව.

09-925

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - කුරුණෑගල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

පොල් වගාව සහිත ඉතා වටිනා කෘෂිකාර්මික ඉඩමක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කුලියාපිටිය නගරයට නුදුරුව රත්මලේ ගමේ පිහිටි "රත්මලේ වත්ත" නමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුල පිහිටි ගහකොළ, වගාව ඇතුලු අනෙකුත් සියලු දේ සමග ඉඩමේ ප්‍රමාණය - අක්කර 25 රූඩ් 2 පර්චස් 38 යි.

මෙම දේපල, "සුජාතා වල්ගම්පාය ප්‍රොපර්ටි සේල්ස් කොම්පැනි"යන නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය හිටිහාමි මුදියන්සේලාගේ සුජාතා මැණිකේ වල්ගම්පාය (දැන් මියගිය) යන අය ණයකරු ලෙසට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

(ඉහත කී හිටිහාමි මුදියන්සේලාගේ සුජාතා මැණිකේ වල්ගම්පායට අයත් එකී දේපල සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාත් බලකරු ලෙසට වීරසේකර මුදියන්සේලාගේ දිසානායක වල්ගම්පාය යන අයව කුරුණෑගල දිසා අධිකරණ නඩු අංක 7410/ටී යටතේ පත්කර ඇත.)

2006 ක් වූ ඔක්තෝබර් මස 27 වන දින පෙ.ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.03.10 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2006.02.28 වැනි දින ලංකාදීප, ද අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– කුරුණෑගල නගර මධ්‍යයේ සිට කුලියාපිටිය මාර්ගයේ සැතපුම් 23 ක් පමණ ලබ්බයාය දක්වා ගමන්ගෙන වමට හැරී කිලෝමීටර් 2ක් පමණ ගමන්ගත් විට මෙම පාරේ දකුණු දෙසින් අදාල දේපල පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා

රු. 2000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයට හෝ කුරුණෑගල ශාඛාව වෙත ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :
කළමණාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, කුරුණෑගල ශාඛාව, අංක 04, සුරතිස්ස මාවත, කුරුණෑගල.

දුරකථන අංක : 037-2224556 - 8, 037-2223892. 037-2224092
ෆැක්ස් අංකය : 2222749

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974,
071-4213497, 071- 2755974
ෆැක්ස් අංකය : 081-2211025

09-896/2

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - කුරුණෑගල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පොල් වගාව සහිත වටිනා ඉඩමක් වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල ප්‍රාදේශීය සහා සීමාවන් තුල කුරුණෑගල - පුත්තලම මහා මාර්ගයට නුදුරුව පහලබඩලාව ගමේ කීනගස්පිටිය පාරේ පිහිටි "ගල්මහපල්ල එස්ටේට් *නොහොත්* බඩල්වත්ත" නමැති ඉඩමෙන් බෙදූ කොටසක් සහ එහි තුල පිහිටි ගහකොළ, වගාව ඇතුලු අනෙකුත් සියලු දේ සහිත ඉඩමේ ප්‍රමාණය - අක්කර 09, පර්චස් 14 යි.

මෙම දේපල "සුජාතා වල්ගම්පාය ප්‍රොපර්ටි සෙල්ස් කොම්පැනි" යන නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය හිටිහාමි මුදියන්සේලාගේ සුජාතා මැණිකේ වල්ගම්පාය (දැන් මියගිය) යන අය ණයකරු ලෙසට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

(ඉහත කී හිටිහාමි මුදියන්සේලාගේ සුජාතා මැණිකේ වල්ගම්පායට අයත් එකී දේපල සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාත් බලකරු ලෙසට වීරසේකර මුදියන්සේලාගේ දිසානායක වල්ගම්පාය යන අයව කුරුණෑගල දිසා අධිකරණ නඩු අංක 7410/ටී යටතේ පත්කර ඇත.)

2006ක් වූ ඔක්තෝබර් මස 27 වන දින ප.ව. 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.03.10 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.03.02 වන දින ලංකාදීප, ද අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– කුරුණෑගල නගර මධ්‍යයේ සිට පුත්තලම මාර්ගයේ කිලෝමීටර් 3 1/2 ක් පමණ පෙල්ලන්දෙණිය දක්වා ගමන්කර වම් දෙසින් පිහිටි කීනගස්පිටිය පාරට පිවිස මීටර 200ක් පමණ ගමන්කර දකුණට හැරී මෙම පාරේ මීටර් 600 ක් පමණ ගමන් කළ විට අදාල දේපල පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයට හෝ කුරුණෑගල ශාඛාව වෙත ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.

කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, කුරුණෑගල ශාඛාව, අංක 4, සුරතිස්ස මාවත, කුරුණෑගල.

දුරකථන අංක : 037-2224556-8, 037-2223892, 037-2224092
ෆැක්ස් අංකය : 037-2222749

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් අංකය - 081-2211025

09-896/1

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

ඊස්ට් වෙස්ට් ටෙක්ස්ටයිල්ස් ලංකා ලිමිටඩ්
ගිණුම් අංක : 0009 2000 0908/0998 1000 0917

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.08.26 වන දින යෝජනා කොට සම්මත කර ගනු ලැබූ 2004.11.19 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2004.10.11 දින "දිනමිණ", "ඩේලිනිව්ස්" සහ 2004.10.12 වන දින "තිනකුරල්" යන දිනපතා පුවත්පත්වල ද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව ඇමරිකන් ඩොලර් හත් ලක්ෂ හැටතුන් දහස් පන්සිය හැත්තෑ හයයි ශත හතක (USD763,576.07) මුදල සමග ඇමරිකන් ඩොලර් පන් ලක්ෂයක (USD 500,000) මුදල සඳහා ලන්ඩන් ඉන්ටර් බැන්ක් මගින් නියම කළ වසරකට සියයට තුන (LIBOR + 3%) බැගින් සහ ඇමරිකන් ඩොලර් හත් දහස් දෙසිය පනහයි ශත හැත්තෑ හතරක (USD 7,250.74) මුදල සඳහා වසරකට සියයට දහය (10%) බැගින් 2001 ඔක්තෝබර් 31 වැනිදා සිට වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් 2006.10.19 දින පෙ.ව. 11.00 ට කොළඹ 03, ධර්මපාල මාවත, අංක 554 හි ෂොක්මන් සහ සමරවික්‍රම කාර්යාල පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, ගෝනවිල මාකඳුර වරිපනම් අංක 63, 66, 68, 69, 71, 76 සහ 77 දරන පරිශ්‍රයන්හි සහ ඉහත කී දිස්ත්‍රික්කයේ දැනට හෝ යම් කාලයක හෝ කලින් කලට හෝ ව්‍යාපාරික කටයුතු කරගෙන යන ගුදම්, ගබඩා සහ පරිශ්‍රයන් තුල හෝ මත සම්පූර්ණ හෝ එක් එක්, වෙළඳාමට අයත් බඩුබාහිරාදිය, ද්‍රව්‍ය, නිමාකළ හා නිමා නොකළ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, උපකරණ, උපාංග සහ අමු කපු සහ/හෝ පොලියෙස්ටර් ස්ටේපල් ෆයිබර්, කපු නූල් T/C නූල්, PVS ප්‍රමාණකරන ද්‍රව්‍ය, දේශීය කෝන් ස්ටාච්, නවීකරණය කළ කොන් ස්ටාච්, නොරේසින් 407, සයිසින් වැක්ස් SICO 52 D, CAMK ප්‍රිසවේටිව් - NA (බ්‍රේයර්), රෙදි අසුරන වානේ පටි/ පොලිප්‍රොපිලින් ස්ට්‍රැපින්, පොලිප්‍රොපිලින් අසුරුම් තහඩු, නිමා කළ අළු රෙදි සහ අනෙකුත් සියළුම ද්‍රව්‍ය සහ සම්පූර්ණ හා එක් එක් නිමාකළ අළු රෙදි සහ අනෙකුත් ද්‍රව්‍ය සියල්ල සහ සම්පූර්ණ හා එක් එක් ගෘහ භාණ්ඩ වැද්දුම් සහ සෑම ආකාරයක සහ කවරාකාරයක හෝ මින් ඉදිරියට සාමූහිකව බන්ධන්දායිගේ වෙළඳාමට අයත් බඩුබාහිරාදිය, ද්‍රව්‍ය, නිමාකල සහ නිමා නොකල භාණ්ඩ ලෙස හැඳින්වෙන) හෝ එම වෙළඳාමට අයත් බඩු බාහිරාදිය, නිමාකල සහ නිමා නොකළ බන්ධනදායිගේ කවරාකාර හෝ සෑම ආකාරයේම, මෙම ගිවිසුම් ක්‍රියාත්මක වන කාලය තුල කලින් කලට සහ සෑම කල්හිම මින් ඉදිරියට බන්ධන්දායී විසින් කලින් කලට හෝ ඕනෑම කලක වෙනත් ස්ථානයක් හෝ ස්ථානයන් වෙත ගෙනඑනු ලබන. ඒ ස්ථානයන්හි අතුරා තබන, තිබෙන්නට සලස්වන සහ මින් ඉදිරියට සොයාගනු ලබන සහ ව්‍යාපාර කටයුතු කරගෙන යන හෝ වෙළඳාමෙහි හෝ ගබඩාවේ තැන්පත් කරනු ලබන බන්ධන්දායීගේ වෙළෙන්දාට අයත් බඩු බාහිරාදිය. නිමා කළ හා නිමා නොකළ භාණ්ඩ සහ උපාංග ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-902

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2504400183

ණයකරුවන්ගේ සම්පූර්ණ නම් : ආරියපෙරුම රාජකරුණා සෙනෙවිරත්න
අප්පුහාමිලාගේ දොන් හේමචන්ද්‍ර
රාජකරුණා සහ දෙහිවෙදගේ බේබිනෝනා

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.08.11 වැනි දින අංක 1455 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.09.15 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 83/5, බෝමලුව පාර, වටපුලුව, මහනුවර ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් 2006.10.20 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් දෙදහස් හැත්තෑ තුනයි ශත හැත්තෑ තුනක (රු. 2,42,073.73) මුදලක් වර්ෂ 2004.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූපන්දහස් හයසිය තුනයි ශත අසූහතක (රු. 1,95,603.87) මුදල ද, 2004.07.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස් හයදහස් හාරසිය හැටනවයයි ශත අසූහයක් (රු. 46,469.86) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස් දෙදහස් හැත්තෑ තුනයි ශත හැත්තෑ තුනක (රු. 2,42,073.73) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූපන්දහස් හයසිය තුනයි ශත අසූහතක (රු. 1,95,603.87) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොළියක් 2004.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, තුන්කෝරළේ, පනාවල කෝරළේ. දෙහිඕවිට ප්‍රාදේශීය සභා සීමාවේ, මාදොල ග්‍රාමයෙහි පිහිටි හෙලරිෆීල්ඩ් එස්ටේට් නැමැති ඉඩමට 1994.11.14 දින එන්. පී.ඇල්විටිගල මානකතැන විසින් මැන සම්පාදිත අංක 546 පිඹුර ප්‍රකාර ලොට් 299 ට මායිම් උතුරට : ලොට් 300 ද ; නැගෙනහිරට : පිඹුරු අංක 426ජ් හි ලොට් 2 හි ඉතිරි කොටස ද ; දකුණට: ලොට් 298 ද ; බටහිරට : ලොට් 271 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම පහයි බිංදුවක (අක්. 00, රූ. 00, පර්. 14.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමඟ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 67/48 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-919

---

## සබරගමුව සංවර්ධන බැංකුව - (රත්නපුර ශාඛාව)

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ දකුණු උඩ පත්තුවේ, ගුරුලුවාන පිහිටි උග්ගලහේනවත්ත *හෙවත්* උඩපත්තුවේ, ගුරුලුවාන පිහිටි උග්ගලහේනවත්ත *හෙවත්* තිබ්බොටුවක්කවවත්ත නැමැති ඉඩමේ ලොට් අංක 2 දරන ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් අ. 0,රූ.0, පර්. 26ක් විශාල ඉඩම ඊට අයත් ගහකොළ පළතුරු ආදී සියලුම දේද වේ.

සබරගමුව සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2006 ක් වූ ඔක්තෝබර් මස 15 වන දින පෙ.ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.– 2004.11.05 වෙනි දින රජයේ *ගැසට් පත්‍රයේ ද,* 2005.12.12 වැනි දින රජයේ පුවත්පත් වලට ද පළ වී ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– රත්නපුර නගරයේ සිට ගමන් කරන විට සිරිපාගම පාර හමුවේ. එතැන් සිට කිලෝමීටර් 17 ක් පමණ දුරින් මෙම දේපල වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වෙතොත් එම මුදල,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ, මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත රත්නපුර බණ්ඩාරනායක මාවතේ, අංක 28හි සබරගමුව සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතා වෙත ගෙවිය යුතුය. දුරකථන අංක : 045-2225417, 045–2231214.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක.
උසාවියේ කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
සාමදාන විනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ.

දුරකථන අංකය : 2419126

09-877

---

## මහජන බැංකුව - ගල්ගමුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාසයේ වන්නි හත්පත්තුවේ, මීඔයෙන් එගොඩ කෝරළේ, අංක 6 සෝලේ වැව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ රාජාංගන වම්ඉවුර යාය 4 නැමැති ගමේ පිහිටා ඇති අංක එෆ් 13/33.41.42 දරන ක්ෂේත්‍ර පත්‍රයෙන් අංක ටෝපෝ. පී. පී. 18 දරන පිඹුරෙහි අංක 1845 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ගෙවත්ත යනුවෙන් හඳුන්වනු ලබන රජයේ ඉඩම, විශාලත්වය අංක 01, රූ. 03, පර්. 23.63ක් විශාල ඉඩම සහ ඒ තුල වූ ගහකොළ පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේද. මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2006.10.18 දින පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2004.09.29 දින රජයේ ගැසට් පත්‍රයේ ද 2004.12.03 දින "දිනමිණ" පුවත්පතේ ද, දින දී 2004.12.03 දින ඩේලි නිව්ස් පුවත්පතේ ද, 2004.12.03 දින දී තිනකරන් පුවත් පතේ පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*— ගල්ගමුව නගරයේ සිට අනුරාධපුර පාරේ මහගල්කඩවල දක්වා ගමන් කර මහගල්කඩවලින් වමට හැරී සෝලෙ වැව පාරේ, වරා වැව හන්දිය දක්වා ගමන්කර දකුණට හැරී සෝලෙ වැව බොරළු පාරේ කි.මීටර් 2 1/2ක් ගමන්කර දකුණට හැරී බොරළු පාරේ මීටර් 100ක් ගමන් කළ විටදී පාරේ දකුණු පසින් දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දිනසිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය

දුරකථන අංකය : 037 – 2222453
ෆැක්ස් 037 - 2222338 හිමිකම් හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිළෙන් 10%ක (සියයට දහයක) මුදල ආපසු නොගෙවීමටත් දේපල නැවත විකිණීමටත් බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 28, නව නීතිඥ සහ වෙළෙඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.

දුරකථන අංකය : 037–2220062

09-869

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100005193.

ණයකරුගේ සම්පූර්ණ නම : මහතෙල්ගේ ටියුසන් සමන්ත පීරිස් සහ ලිදමුලගේ රංජනි සිල්වා

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.08.20 වන දින අංක 1355 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.08.21 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව හි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මහතා විසින් 2006.10.20 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්නව දහස් හත්සිය හතලිස් හයයි ශත හැටහයක (රු. 1,59,746.66) මුදලක් වර්ෂ 2003.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසිදෙදහස් දෙසිය හැත්තෑපහයි ශත එකළොහක (රු. 1,22,275.11) මුදල ද, 2004.07.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්හත් දහස් හාරසිය හැත්තෑ එකයි ශත පනස්පහක් (රු. 37,471.55) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස්නව දහස් හත්සිය හතලිස් හයයි ශත හැටහයක් (රු. 1,59,746.66) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසිදෙදහස් දෙසිය හැත්තෑපහයි ශත එකළොහක (රු. 1,22,275.11) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2003.08.11 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තුද අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, මොරටුව නගර සහා සීමාවේ එගොඩ උයන ග්‍රාමයේ මහවත්ත පාරේ වරිපනම් අංක 250/11 හි පිහිටි මාදන්ගහවත්ත නැමැති ඉඩමට 1993.10.30 දින බී.එල්. ඩී.ප්‍රනාන්දු මානකතැන විසින් මැන සම්පාදිත අංක 4162 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම් උතුරට : අඩි 20ක් පළල පාර ද ; නැගෙනහිරට : බී. සී. එස්. සිරිරත්නට අයත්ව තිබූ මෙම ඉඩමේම කොටසක් ද ; දකුණට සහ බටහිරට : බී. ඩී. එස්. සිරිරත්නට අයත් එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුල පර්චස් හයක් (අක්. 0 රූ. 0 පර්. 6) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද, මාර්ග පරවශතාවයද සමඟ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1979/119 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-914

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0200002616.

ණයකරුගේ සම්පූර්ණ නම : ලිණියා කුමාරගේ පාලිත ජැක්සන් කුමාර *හෙවත්* ලිණියා කුමාරගේ පාලිත ජැක්සන් කුමාර

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.09.08 වන දින අංක 1459 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.09.15 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 220/5, ගම්පහ පාර, යක්කල හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. වික්‍රමරත්න මහතා විසින් 2006.10.19 වන දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන් ලක්ෂ හැටපන් දහස් එකසිය අනූපහයි ශත හැත්තෑ නවයක (රු. 3,65,195.79) මුදලක් වර්ෂ 2006.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ තිස්අට දහස් නවසිය හැටදෙකයි ශත අනූහයක (රු. 3,38,962.96) මුදල ද, 2006.03.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිහය දහස් දෙසිය තිසිදෙකයි ශත අසූතුනක් (රු. 26,232.83) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන් ලක්ෂ හැටපන් දහස් එකසිය අනූපහයි ශත හැත්තෑ නවයක (රු. 3,65,195.79) ද,

(2) එකී රුපියල් තුන් ලක්ෂ තිස්අට දහස් නමසිය හැටදෙකයි ශත අනූහය (රු. 3,38,962.96) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.50% බැගින් වන පොළියක් 2006.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු ද අයකර ගැනීමට.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අළුත්කුරු කෝරළේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ පෙතියාගොඩ ග්‍රාමයේ ගොරොක්ගහවත්ත නැමැති ඉඩමට 2003.02.12 දින කේ. කේ. ඒ. එස්. පද්මිණි මානකතැන විසින් මැන සාම්පාදිත අංක 3667 පිඹුර ප්‍රකාර ලොට් බී ට මායිම් උතුරට: ලොට් ඒ ද ; නැගෙනහිරට : රංජනි වීරසූරියගේ ඉඩම ද ; දකුණට : ලොට් බී ද ; බටහිරට : මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතක (අක්.0, රූ.0, පර්. 17) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවය ද සමඟ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 334/172 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-916

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2400000888.

ණයකරුගේ සම්පූර්ණ නම : පොල්ගම්පල මුදියන්සේලාගේ රන්ජිත්.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.08.13 වන දින අංක 1354 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.08.13 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 134, බැද්දෙගාන, කෝට්ටේ හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මහතා විසින් 2006.10.18 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හත්දහස් දෙසිය හතළිස් එකයි ශත නවයක (රු. 2,07,241.09) මුදලක් වර්ෂ 2003.11.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැටහයදහස් හත්සිය පනහයි ශත විසිඑකක (රු. 1,66,750.21) මුදල ද, 2003.11.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් දහස් හාරසිය අනූවයි ශත අසූඅටක් (රු. 40,490.88) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හත්දහස් දෙසිය හතලිස් එකයි ශත නවයක (රු. 2,07,241.09) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැටහයදහස් හත්සිය පනහයි ශත විසිඑකක (රු. 1,66,750.21) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90% බැගින් වන පොළියක් 2003.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, නැගෙනහිර අතුළුගම් කෝරළේ, දැරණියගල ප්‍රාදේශීය සභා සීමාවේ දැරණියගල ග්‍රාමයේ, මාලිගාතැන්න වත්ත නැමැති ඉඩමට 2001.02.12 දින ආර්. එච්. පී. සමරදිවාකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 468 පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම් උතුරට : 4017 පිඹුරේ කැබලි අංක 31 ද; නැගෙනහිරට : 4017 පිඹුරේ කැබලි අංක 19 ද; දකුණට : 4017 පිඹුරේ කැබලි අංක 33 ද ; බටහිරට: ආර් 4 (අඩි 15 පළල පාර ) ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අක් 00, රූ. 00 පර්. 20) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමඟ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කියු 102/100 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-917

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0104400654.

ණයකරුගේ සම්පූර්ණ නම : ලියනගේ චාන්දනී මල්කාන්ති පෙරේරා.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.08.04 වන දින අංක 1454 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.08.28 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක්

ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 134, බැද්දේගාන, කෝට්ටේ හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. .සේනාපති මහතා විසින් 2006.10.19 වන දින පෙ.ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් හයදහස් නවසිය හැටහතයි ශත එකළොහක (රු. 2,46,967.11) මුදලක් වර්ෂ 2005.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දෙදහස් අටසිය තිස්පහයි ශත අසූහතක (රු. 2,02,835.87) මුදල ද, 2005.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස් හතරදහස් එකසිය තිස්එකයි ශත විසිහතරක් (රු. 44,131.24) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතළිස් හයදහස් නවසිය හැටහතයි ශත එකළොහක (රු. 2,46,967.11) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දෙදහස් අටසිය තිස්පහයි ශත අසූහතක (රු. 2,02,835.87) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% බැගින් වන පොළියක් 2005.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙ පත්තුවේ, කඩුවෙල (අතුරුගිරිය උපකාර්යාල සීමාවේ) ප්‍රාදේශීය සභා සීමාවේ, හෝකන්දර ග්‍රාමයෙහි පිහිටි දෙල්ගහවත්ත නැමැති ඉඩමට 1987.07.02 දින අයි. එම්. සී. ප්‍රනාන්දු මානකකතෘන විසින් මැන සම්පාදිත අංක 539ඒ පිඹුර ප්‍රකාර ලොට් 19ට මායිම්, උතුරට : පිඹුරු අංක 169 හි ලොට් 1 ද; නැගෙනහිරට : එස්. එදිරිසිංහට අයත් ඉඩම ද ; දකුණට : ලොට් 18 ද ; බටහිරට : ලොට් 26 (පාරට වෙන්කරන ලද කොටස ) ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම එකයි එකක (අක්. 00 රූ. 00 පර්. 15.11) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද මාර්ග පරවශතාවය ද සමඟ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1057/02 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-918

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900001710.

ණයකරුගේ සම්පූර්ණ නම : සමරවික්‍රම කුරුප්පුගේ ධර්මදාස සහ දිසානායක ආරච්චිලාගේ හැරියට්

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.09.08 වන දින අංක 1459 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.08.26 වන දින "ලක්බිම",පුවත්පතෙහි ද, 2006.08.26 වැනි දින "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 22, ප්‍රනාන්දු ඇවනියු ඩයස් ගරාජ් ගොඩනැගිල්ල මීගමුව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් 2006.10.17 වන දින පෙ.ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතළිස් නවදහස් හත්සිය තිස්හතයි ශත අසූතුනක (රු. 2,49,737.83) මුදලක් වර්ෂ 2002.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් ලක්ෂඅසූදහසක (රු. 1,80,000) මුදල ද, 2002.09.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැටනව දහස් හත්සිය තිස්හතයි ශත අසූතුනක් (රු. 69,737.83) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතළිස් නවදහස් හත්සිය තිස්හතයි ශත අසූතුනක් (රු. 2,49,737.83) ද,

(2) එකී රුපියල් එක් ලක්ෂ අසූදහසක (රු. 1,80,000.) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.23% බැගින් වන පොළියක් 2002.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දෙමළ හත්පත්තුවේ, පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභාවේ, ආනමඩුව ග්‍රාමයෙහි පිහිටි පලුගහකැලේ

දැනට පලුගහමුලහේන නැමැති ඉඩමට 1987.10.15 දින ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර මානකතැන විසින් මැන සම්පාදිත අංක 163/87 පිඹුර ප්‍රකාර ලොට් 44 ට මායිම්, ඊසානට: පුත්තලම පාර ද ; ගිණිකොනට : ලොට් 45 ද ; නිරිතට : ලොට් 76 ද; වයඹට : ලොට් 43 ද යන මායිම් තුළ පිහිටි පර්චස් හයක් (අ.0, රූ. 0 පර්. 6) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද සමඟ පුත්තලම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස්. 42/208 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-920

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0704400033.

ණයකරුගේ සම්පූර්ණ නම : කාරියවසම් කනත්තගේ පාලිත සරත්.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.10.14 වන දින අංක 1415 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.11.07 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, කුරුඳුවත්ත වල්ගම, මාතර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මහතා විසින් 2006.10.18 වන දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැටහතර දහස් තුන්සිය අසූහයක (රු. 2,64,386) මුදලක් වර්ෂ 2002.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ තුන්දහස් හයසිය හැටනමයයි ශත හැටදෙකක (රු. 2,03,669.62) මුදල ද, 2002.12.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හැටදහස් හත්සිය දහසයයි ශත තිස්අටක් (රු. 60,716.38) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හැටහතර දහස් තුන්සිය අසූහයක් (රු. 2,64,386) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ තුන්දහස් හයසිය හැටනමයයි ශත හැටදෙකක (රු. 2,03,669.62) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% බැගින් වන පොලියක් 2003.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, පිහිටි අම්බලන්ගොඩ නගර සභා සීමාවේ, විලේගොඩ හීගල්දූව පාරේ, වරිපනම් අංක 13/3 හි පිහිටි හීගල්දූවේවත්ත කැබැල්ල සහ හීගල්දූවේවෙල *හෙවත්* ඔව්ට නමැති ඉඩම 1992.10.02 දින සහ 1992.09.30 දින වික්ටර් ගොඩහේන මානක තැන විසින් මැන සැකසූ පිඹුරු අංක 119 ප්‍රකාර කැබලි අංක 01 ට මායිම්, උතුරට : එම්. ඩබ්ලිව්. සිලින් සිල්වාට අයිති ඉඩම ද ; නැගෙනහිරට : පියදෝරිස් වඩුරාලගේ වෙල ද ; දකුණට : කැබලි අංක 02 ද ; බටහිරට : කුසලාවදූගේ වත්තෙහි කැබලි අක 07 සහ පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ. 0 රූ.0 පර්. 10) වපසරියකින් යුතු වූ මෙම ඉඩම මාර්ග පාර්ශවතාවය ද සමඟ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ. 168/13, 206 හි හි ලියාපදිංචි කරන ලදී.

වර්ෂ 2006ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-921

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0200002615.

ණයකරුගේ සම්පූර්ණ නම : පුනනුල්කාරගේ සනත් සඳමාල් පෙරේරා.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.09.08 වන දින අංක 1459 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.09.15 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. වික්‍රමරත්න මහතා විසින් 2006.10.19 වන දින පෙ. ව. 10.45 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් දහස් එකසිය දහසයයි ශත හතළිස් හතක (රු. 240,116.47) මුදලක් වර්ෂ 2006.03..31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ විසිපන්දහස් නවසිය හැත්තෑ පහයි ශත විසිහයක (රු. 2,25,975.26) මුදල ද, 2006.03.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහහතර දහස් එකසිය හතලිස් එකයි ශත විසිඑකක් (රු. 14,141.21) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස් දහස් එකසිය දහසයයි ශත හතලිස් හතක (රු. 2,40,116.47) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ විසිපන්දහස් නවසිය හැත්තෑ පහයි ශත විසිහයක (රු. 2,25,975.26) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.50% බැගින් වන පොළියක් 2006.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ අළුත්කුරු කෝරලේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ පෙතියාගොඩ ග්‍රාමයේ ගොරොක්ගහවත්ත නැමැති ඉඩමට 2003.02.12 දින කේ. කේ. ඒ. එස්. පද්මිණී මානකතැන විසින් මැන සම්පාදිත අංක 3667 පිඹුර ප්‍රකාර ලොට් සී ට මායිම් උතුරට ලොට් බී ද, නැගෙනහිරට රංජනී වීරසූරියගේ ඉඩම ද, දකුණට ප්‍රාදේශීය සභා පාර ද, බටහිරට මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාර ද, යන මායිම් තුල පිහිටි පර්චස් දහඅටයි දශම පහක (අක්. 0 රූ. 0 පර්. 18.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 333/118 හි ලියා පදිංචි කර ඇත.

වර්ෂ 2006ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-915